


CED Sri Lanka
Quality Education For All
අධ්‍යාපන සංවර්ධන සන්ධානය

ත්‍රෛමාසික අධ්‍යාපනික පුවත් සඟරාව කලාපය 2024 ජූලි


ඡායාරූපය අන්තර්ජාලයෙන්

# රටක අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, එහි අනාගත පරපුරේ සංවර්ධනයට මග පාදයි

දකුණු ආසියානු කලාපයේ රටවල් අතරින් ශ්‍රී ලංකාව, ඉහළ මානව සංවර්ධන දර්ශකයක් (මානව සංවර්ධන දර්ශකය 0.782, 2023) ඉහල සාක්ෂරතාවයක් (සාක්ෂරතා අනුපාතය 92.43%,2022) මෙන්ම, ගෝලීය දැනුම් දර්ශකය තුළ (ගෝලීය දැනුම් දර්ශකය 91, 2023) ඉහළ අගයක් ලබාගනිමින් ඉහල අධ්‍යාපනික ප්‍රගතියක් අත්කරගෙන තිබෙන බව නොරහසකි. 1940ට පෙර යුගයේදී අධ්‍යාපන ප්‍රවේශකත්වය ලබා ගත හැකි වූයේ සීමිත පිරිසකට පමණක් වූ අතර ඒ ප්‍රභූ පැලැන්තියට හා ආගමික නායකයින්ට පමණි. එබැවින් 1940න් පසු කාලයේදී ජාති, ආගම් භේදයකින් තොරව සැමට සමාන අධ්‍යාපන ප්‍රවේශකත්වයක් ලබාදීම අරමුණ විය. එසේ විකාශනය වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්හි ප්‍රතිඵලයක් ලෙස වර්තමානය වන විට ගුණාත්මක, ඵලදායි හා අර්ථාන්විත අධ්‍යාපනයක් සැමට ලබාදීම අරමුණ වී තිබේ. කෙසේ නමුත්, ශ්‍රී ලංකාවේ එදා සිට අද දක්වාත් දේශපාලන බලාධිකාරය ලබාගන්නා දේශපාලන කණ්ඩායම් විසින් විවිධ අධ්‍යාපන ප්‍රතිපත්ති ගෙන ඒම හඳුනාගත හැකිය. එසේ ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය සම්බන්ධයෙන් දේශපාලන කණ්ඩායම් විසින් තීරණ ගැනීම යුක්ති යුක්ත වන්නේද, එපමණක් නොව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ගන්නා ලද ප්‍රතිපත්ති ඵලදායි වී තිබේද, විධිමත් අධීක්ෂණයකින් යුතුව ඉදිරිපත් කොට තිබේද, යනාදී කරුණු සම්බන්ධයෙන් වර්තමානය වන විට අධ්‍යාපනික ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් අතර විවාදාත්මක කතිකාවතකට ලක්ව තිබේ.

අද වන විට, ගෝලීය වශයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල්වල තවමත් මිලියන 57 ක දරුවන් ප්‍රාථමික අධ්‍යාපනයෙන් බැහැරව සිටිති. තවද, ලෝකයේ සෑම ගැහැණු දරුවන් 04 දෙනෙකුගෙන් එක් දරුවෙක් පාසල් අධ්‍යාපනය නොලබයි (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන). මේ අනුව තවමත් සැමට අධ්‍යාපනය ලබාදීම අදටත්

3 වන පිටුවට

## ඇතුළත

ශ්‍රී ලංකාව පිළිබඳ මූලික දත්ත හා රජයේ පාසල් පිළිබඳ මූලික තොරතුරු → 2
ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය සහ සමසාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන සංවර්ධන සන්ධානය නව ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලබයි → 6-7
ආපදා කළමනාකරණ උපායමාර්ග සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය → 8-10
බුද්ධිමය දුබලතා සහිත හෙවත් සෙමෙන් මනස වැඩෙනවුන්ගේ අධ්‍යාපන අවශ්‍යතා → 11-12
වැඩි දියුණු කරන ලද ChatGPT → 14
මීළඟ කලාපයෙන්, ඔබේ හඬට, අපෙන් පිටුවක්.... → 15
අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ 2024 වසරේදි පවත්වන ලද ධාරිතා සංවර්ධන සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් → 16

**අපේ දැක්ම**

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්ත්වයන් නොසළකා සියලු දෙනාටම ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම.

**අපේ මෙහෙවර**

සියලු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසියන් මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා දිරිගැන්වීම ද අධ්‍යාපනික සංවර්ධනය උසස්ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සංවිධාන හා පුද්ගලයන් දිරිමත් කිරීම

**අපගේ අරමුණු**

1. සැමට ගුණාත්මක හා සම අධ්‍යාපනයකට අවස්ථාවන් සළසන ජාතික හා පළාත් අධ්‍යාපන ප්‍රතිපත්තීන් සිවිල් සමාජ සංවිධානයන්ගේ දායකත්වය ගෙන ඒමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සහ එය ප්‍රවර්ධනය කිරීම.
2. හැකි උපරිම මට්ටමින් ජාතික අවශ්‍යතාවන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති, ප්‍රතිසංස්කරණ සහ සැළසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් හා පෙළඹ වීම් කිරීම.
3. කිසිවෙකුත් මඟ නොහැරෙන ආකාරයෙන් සහ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අන්තර්ගත වන පරිදි අධ්‍යාපන සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය පිණිස සියලුම මට්ටම්වල සිවිල් සංවිධාන කණ්ඩායම්වල සහ ජාලයන්ගේ කුසලතාවන් ශක්තිමත් කිරිම.
4. ගුණාත්මක සහ සාධාරණ අධ්‍යාපනයක් සහතික කිරීම උදෙසා අධ්‍යාපන ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීම සහ නිර්දේශයන් සිදු කිරීම.

## ශ්‍රී ලංකාව පිළිබඳ මූලික දත්ත හා රජයේ පාසල් පිළිබද මූලික තොරතුරු

| | |
|---|---|
| Population | 21,864 (2023) |
| GNI per Capita (PPP$) | 11,899 (2017 PPP $), |
| Income Group | Lower-Middle Income |
| HDI: Value/Rank | 0.780/ 78th (2023) |
| Gini Index | 37.7 (2019) |
| Education Expenditure (% GDP) | 1.20% (2022) |
| Upper Secondary Completion Rate<br>Female / Male | 78% Male 84.8% Female (2020)<br>(MoE) |
| Literacy Rate (15-64 Yrs.)<br>Female / Male | 92.5 (2022)<br>91.8 / 93.3 |
| 2024 SDG Score/Rank | 67.43 / 93th |
| SDG 4 Trend<br>SDG 4 Dashboard | Significant challenges<br>↑ On track |

| | |
|---|---|
| මුළු පාසල් ගණන | 11,077 |
| රජයේ පාසල් ගණන | 10,155 |
| පිරිවෙන් ගණන | 802 |
| පෞද්ගලික හා විශේෂ පාසල් ගණන | 120 |
| මුළු ශිෂ්‍යයන් ගණන | 4,269,802 |
| රජයේ පාසල්වලින් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් ගණන | 4,063,685 |
| පිරිවෙන් අධ්‍යාපනය ලබන ගණන | 69,709 |
| පෞද්ගලික හා විශේෂ අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් ගණන | 136,408 |
| මුළු ගුරුවරුන් ගණන | 264,308 |
| රජයේ පාසල්වල ගුරුවරුන් ගණන | 249,494 |
| පිරිවෙන් අධ්‍යාපනයේ ගුරුවරුන් ගණන | 7,593 |
| පෞද්ගලික හා විශේෂ පාසල් ගුරුවරුන් ගණන | 7,221 |

(මුලාශ්‍රයః අධ්‍යාපන අමාත්‍යංශය, 2021)

References:
UNESCO Institute of Statistics (UIS) Data Center https://data.uis.unesco.org/
The Human Development Report 2023-2024
https://hdr.undp.org/data-center
The Sustainable Development Report 2024

**සංස්කාරක සටහන**
මෙහි පළවන ලිපිවල අන්තර්ගත කරුණුවල දැක්වෙන අදහස් සහ මත එම ලිපිවල කතෘවරුන් පෞද්ගලික වශයෙන් දරණ ඒවාය. ඒවායේ අන්තර්ගත කරුණු සහ අදහස් අත්‍යාවශ්‍යයෙන් ම අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අදහස් නොවන බව කරුණාවෙන් සළකන්න.

අධ්‍යාපන සංවර්ධන සන්ධානය
නො. 17, ධර්මපාල මාවත,
රාජගිරිය.

**හඬ සඟරාව උපදේශක මණ්ඩලය**
කේ. ඩී. පීරිස් මහතා, වජිර උමගලිය මහතා, මහින්ද සිල්වා මහතා, එම්. ඒ. ජේ. රියාස් මහතා, එස්. පී. මෝහන් මහතා

CED Sri Lanka
Quality Education For All
අධ්‍යාපන සංවර්ධන සන්ධානය

## අධ්‍යාපනය සදහා 2023 වසරේ අයවැයෙන් වෙන් වූ මූල්‍යයමය ප්‍රතිපාදන

| | |
|---|---|
| වෙන් කර ඇති මුළු මුදල | රු. බිලියන 504 |
| සාමාන්‍ය අධ්‍යාපනය සදහා වෙන් කර ඇති මුදල | රු. බිලියන 392 |
| විශ්ව විද්‍යාල අධ්‍යාපනය සදහා වෙන් කර ඇති මුදල | රු. බිලියන 97 |
| වෘත්තීය පුහුණු, නිපුණතා අධ්‍යාපන හා පර්යේෂණ සදහා වෙන් කර ඇති මුදල | රු. බිලියන 15 |

(මුලාශ්‍රයః අධ්‍යාපන අමාත්‍යංශය, 2023)

**1 වන පිටුවෙන්**

ගෝලීය සංවර්ධන ගැටලුවක් ව තිබේ. මේ හේතුවෙන් සියලු දෙනාට වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබාදීම අරමුණු කරගනිමින් 2000 වර්ෂයේ දී සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ (MDGs) ඉදිරිපත් විය. 2015 ඉලක්කගත වර්ෂය විය. සහස්‍ර සංවර්ධන අභිමතාර්ථයන්හි 02 වන අභිමතාර්ථය වන "සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලබාදීම" (Achieve universal primary education) අරමුණු කර ගෙන තිබේ. ස්ත්‍රී-පුරුෂ භේදයකින් තොරව සියලු දරුවන් ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම අරමුණ විය. තවද, 2015 දී ඉදිරිපත් වූ තිරසාර සංවර්ධන අභිමතාර්ථ (SDGs) තුළ දී ද, අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අවධානය යොමුව ඇත. එහිදී 2030 ඉලක්කගත වර්ෂය කර ගනිමින් "සියලු දෙනාට සමානාත්මතාවයෙන් යුත්, ගුණාත්මක අධ්‍යාපනයක් හා යාවජීව අධ්‍යාපන අවස්ථා සහතික කිරීම" (Ensure inclusive and equitable quality education and promote lifelong learning opportunities for all) අරමුණ වී තිබේ. මේ අනුව විවිධ කාල සීමාවන් තුළ අධ්‍යාපනය කේන්ද්‍ර කරගනිමින් ගෝලීය වශයෙන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වී තිබේ.

දකුණු ආසියාතික කලාපයේ රටවල්හි අධ්‍යාපනය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ. මන්ද, සියලු රටවල් සංවර්ධනය වෙමින් පවතින රටවල් වීම සුවිශේෂත්වය කි. මෙහිදී ප්‍රාථමික,ද්විතියික,තෘතියික යන අධ්‍යාපන අංශයන් තුළින් ද්විතියික අධ්‍යාපනය සඳහා පවතින සහභාගිත්වය 2022ට අනුව පහත පරිදි හඳුනා ගත හැකිය.

| රට (Country) | වර්ෂය (Most Recent Year) | සහභාගිත්වය (Enrollment-Gross %) |
|---|---|---|
| 1.බංගලාදේශය | 2019 | 73 |
| 2.භූතානය | 2018 | 90 |
| 3.ඉන්දියාව | 2019 | 74 |
| 4.ශ්‍රී ලංකාව | 2018 | 100 |
| 5.පාකිස්ථානය | 2019 | 44 |
| 6.නේපාලය | 2019 | 80 |
| 7.ඇෆ්ගනිස්ථානය | 2018 | 55 |
| 8.මාලදිවයින | 2019 | 81 |

*Sources: V Santhakumar, 2022.*

උක්ත වගුවට අනුව දකුණු ආසියානු කලාපයට අයත් රටවල්හි දරුවන් ද්විතියික අධ්‍යාපනය සඳහා පවතින ප්‍රවේශකත්වය සමස්තයක් ලෙස මධ්‍යස්ථ මට්ටමේ පවතින නමුත් ශ්‍රී ලංකාව හා භූතානය ඉහළ ස්ථානයක පවතී. ශ්‍රී ලංකාවේ ජනගහණය මිලියන 22.18 ක් වන අතර අධ්‍යාපනය සඳහා දළ ජාතික ආදායමෙන් 1.2% ක ප්‍රමාණයක් වෙන කර ඇත (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2022). භූතානයේ ජනගහණය ලක්ෂ 08 කට ආසන්න (782,448) නමුත් එහි අධ්‍යාපනය සඳහා දළ ජාතික ආදායමෙන් 8.1% ක ප්‍රමාණයක් වෙන් කර ඇත (ලෝක සෞඛ්‍ය සංවිධානය, 2022). ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් වුවද, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ මට්ටමක පැවතීම හොඳ ප්‍රවණතාවයක් බව යුක්ති යුක්තය. නමුත් අවධානය යොමු කළ යුතු කරුණ වන්නේ, එය ඵලදායි හා ගුණාත්මක අධ්‍යාපන තත්ත්වයක් සැමට ලබාදිය හැකිද යන්නයි. එහිදී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වඩා වැදගත් වේ.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යනු අධ්‍යාපන න්‍යායන් හා භාවිතයන් අනුව රාජ්‍ය අධ්‍යාපනය වෙනස් කිරීමේ ක්‍රමවේදයයි. මෙහිදී විද්‍යාත්මක අධ්‍යයනයකින් වඩාත් ඵලදායි ක්‍රමවේද, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා මග පාදයි. අධ්‍යාපනය තුලින් ළමයින් ජීවත් වන සමාජය ඔවුන්ට තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සහ වැඩිහිටියන් සමග එක්ව ඵලදායී ලෙස කටයුතු කිරීම සඳහා සූදානම් කර තැබීම කල යුතු වේ. ඔවුන් පාසල් හැරයන විට සැබවින්ම වැඩිහිටියන් බවට පත් වන අතර, ඔවුන්ගේ පවුලේ, සමාජයේ මෙන්ම සමස්තයක් ලෙස සමස්ත ජාතියේම සුබසාධනය සඳහා දායකත්වය ලබා දීමට හැකි වන ලෙස දැනුම හා අනෙකුත් නිපුණතා වලින් ළමයින් සන්නද්ධ කල යුතුය. සාමාන්‍යයෙන් අධ්‍යාපනයෙන් ජාතික අරමුණු කිහිපයක් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරයි. එහිදී ජාතික ඒකාබද්ධතාව, ජාතික ඒකාග්‍රතාව හා ජාතික සමගිය ඇතිකිරීම, සමාජ සාධාරණත්වය ඇති කිරීම, තිරසාර ජීවන රටාවක් ඇතිකිරීම, රැකියා අවස්ථා උත්පාදනය, මානව සම්පත් සංවර්ධනයේදී විවිධ හැකියාවක් ස්ථාපිත කිරීම, වෙනස්වන අවස්ථාවන්ට අනුවර්තනය වීමට ඉගෙනීම, ජාත්‍යන්තර ප්‍රජාව තුල ගෞරවනීය ස්ථානයක් අත්කර ගැනීම සඳහා නිපුණතාවයන් වර්ධනය කිරීම යනාදිය කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම අරමුණු ලගාකර ගැනීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය විධිමත්ව සිදු කිරීම ඉතා වැදගත් ය. 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන වලට අනුව අධ්‍යාපනයේ සියලු අංශ සම්බන්ධයෙන් වග කිවයුතු සියලු අධිකාරීන් හා ආයතන විසින් අනුකූලතාවක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ජනාධිපතිවරයා විසින් කලින් කලට ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතුය. තවද, අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව රටක අධ්‍යාපන ක්‍රමයට මග පෙන්වන මූලධර්ම, අරමුණු හා උපායමාර්ග දක්වා ඇත. විෂයමාලා සංවර්ධනය, ගුරු පුහුණුව, ඇගයීම් ක්‍රම හා අධ්‍යාපනික ප්‍රවේශය වැනි අංග එයට ඇතුලත් වේ.





මේ අනුව සලකා බලන විට, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රැසක් වර්තමානය වන විට හඳුනාගත හැකිය. එහිදී 1945 දී ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වා දෙන ලද නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය මගින් සැමට අධ්‍යාපනික අවස්ථා විවර වූ හැරවුම් ලක්ෂයක් විය. එහිදී වයස අවුරුදු 5ට වැඩි අවුරුදු 16ට නොවැඩි සියලු දෙනාට නිදහස් අධ්‍යාපන ප්‍රවේශකත්වය හිමි විය. තවද, 1972,1977, 1981 දී අධ්‍යාපන අමාත්‍යංශය විසින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙන තිබෙන අතර 1987 දී 13 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් අධ්‍යාපන ප්‍රතිපත්ති ගෙන තිබේ. තවද, 1992 දී ජාතික අධ්‍යාපන කොමිසමේ පළමු වාර්තාව ඉදිරිපත් කර ඇත. 1997 දී ජාතික අධ්‍යාපන කොමිසම හා ජනාධිපති අධ්‍යාපන කමිටුව (Presidential Task Force on General Education, Sri Lanka) විසින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කර ඇත. 2003 දී මානව සංවර්ධනය සඳහා අධ්‍යාපනය පදනම් වූ ජාතික අධ්‍යාපන රාමුවක්, ජාතික අධ්‍යාපන කොමිසම විසින් ඉදිරිපත් කර තිබේ. 2012 දී, නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් විශේෂ පාර්ලිමේන්තු කොමිසම විසින් ඉදිරිපත් කර ඇත. 2016 දී, ඉහල ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම (Raising the Quality of

Education: Proposals for a National Policy on General Education in Sri Lanka) කේන්ද්‍ර කර ගනිමින් ජාතික අධ්‍යාපන කොමිසම අධ්‍යාපන ප්‍රතිපත්ති ගෙන තිබේ. 2019 දී, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජාතික ප්‍රතිපත්තියක් (National Policy on General Education in Sri Lanka) ගෙන තිබේ. 2020 දී කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (Re-emerging Education in Sri Lanka: Transforming the Present System of General Education to a Dynamic and Vibrant Paradigm for 21st Century) ගෙන තිබේ. 2019-2022 කාලසීමාව තුළදී අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්ව විද්‍යාල මට්ටමින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙන තිබේ. 2022 දී, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලියක් ද, ජාතික අධ්‍යාපන කොමිසම විසින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) සකස් කර ඇත. ජනාධිපතිතුමාගේ උපදෙස් මත පත්කරන ලද කැබිනට් අනු කමිටුව විසින්, සකස් කරන ලද නව අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව 2023 සඳහා කැබිනට් අනුමැතිය හිමි ඇත. එසේම, 2023 දී උසස් අධ්‍යාපන අවස්ථාවන් සඳහා වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තු කමිටුව සඳහා ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පනත් හා නීති සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී 1939 දී පනත් කිහිපයක් ඉදිරිපත් කර තිබෙන අතර 1963 දී අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් දී ඒ සඳහා උපදෙස් පත්‍රිකාව ඉදිරිපත් කර තිබේ. 1960 අංක 05 දරන විශේෂ විධිවිධාන පනත මගින් සහයක පාසල් හා පුහුණු විද්‍යාල හඳුන්වා දෙන ලදී. තවද, 1961 අංක 08 දරන සහකාර පාසල් හා පුහුණු විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත ඉදිරපත් කර ඇත. 1981 අංක 65 දරන සහකාර පාසල් හා පුහුණු විද්‍යාල (විශේෂ විධිවිධාන) සංශෝධන පනත ඉදිරිපත් කර ඇත. 1968 දී අංක 25 දරන පොදු විභාග පනත ද, 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත ද, 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත ද, 1986 අධ්‍යාපන විද්‍යාල පනත ද, 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිසම් සභා පනත ද, 2014 නිදහස් අධ්‍යාපන අයිතිය පිළිබඳ පනත් කෙටුම්පත ද, 1983 අධ්‍යාපන කෙටුම්පත් පනත් කෙටුම්පත ද, 2009 ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනත ද, 2019 අධ්‍යාපන පනත් කෙටුම්පත සඳහා වූ යෝජිත රාමුව ද, ඉදිරිපත් කර ඇත.

වර්තමානය වන විට, අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් බොහෝදෙනාගේ අවධානයට ලක් ව ඇත. 2030 වන විට තිරසාර සංවර්ධනයක් කරා, රටක් වශයෙන් අභිමතාර්ථයන් ලඟා කර ගැනීමේදී අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ද, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කළ යුතු වේ. තවද, සැමට ගුණාත්මක අධ්‍යාපනයක් ලඟා කරදීම අරමුණු කර ගනිමින් සිදු කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මෙහිදී වැදගත් වේ. ඒ අනුව 2023-2033 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව වර්තමානයේ ඉදිරිපත්ව තිබෙන ප්‍රතිපත්ති ප්‍රකාශනයයි. ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව රටේ අධ්‍යාපන ක්‍රමයේ දැක්ම සහ දිශානතිය ගෙනහැර දක්වයි. එය සැලසුම් කර ඇත්තේ සියලු දෙනාට සමානාත්මතාවයෙන් සහ උසස් තත්ත්වයේ අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශ වීම පිණිස ය. එහිදී ප්‍රධාන අංග කිහිපයක් ඇතුළත් වේ. විෂයමාලා ප්‍රතිසංස්කරණ, ගුරු පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය, යටිතල පහසුකම් සහ සම්පත් සංවර්ධනය, සියලු දෙනා ඇතුළත් වූ අධ්‍යාපනය, විභාග සහ ඇගයුම් ප්‍රතිසංස්කරණ හා උසස් අධ්‍යාපනය යන අංග ඇතුලත් වේ. මෙම ප්‍රතිපත්ති සැලසුම් කර ඇත්තේ රටේ සමාජ-ආර්ථික සංවර්ධනයට දායක වන අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම සඳහා ය. සෑම රටක්ම එහි නිශ්චිත අවශ්‍යතා සහ ප්‍රමුඛතා අනුව තම රාමුව සකස් කර ගනී. මෙම රාමුව තිරසාර සංවර්ධන ඉලක්ක (SDG 4) වැනි ජාත්‍යන්තර ඉලක්ක සමඟ සමපාත වන අතර ගෝලීය අභියෝග සඳහා සිසුන් සූදානම් කිරීම අරමුණු කරයි.




ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (NEPF) සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා අමාත්‍ය මණ්ඩලය විසින් 2023 දී අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව, NEPF කෙටුම්පත් කිරීමේදී ඉහත සඳහන් කැබිනට් අනු කමිටුවට සහාය වීම සඳහා විද්වත් නිලධාරීන්ගේ කමිටුවක් පත් කර ඇති අතර, එම වාර්තාව 2023 අග භාගයේදී ඉදිරිපත් කරන ලදී. NEPF (2023-2033) කෙටුම්පත් කිරීමේදී, විශේෂිත ලේඛනවල නිර්දේශ කිහිපයක් කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ ප්‍රතිපත්ති යෝජනා (2020), 2024 වසරේ සිට හඳුන්වා දීමට යෝජිත ප්‍රතිසංස්කරණ සහ පාසල් පද්ධති පරිපාලනයට අදාළ සංශෝධන යටතේ 21 වන සියවසේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි පාසල් පද්ධතිය පරිවර්තනය කිරීම සඳහා නව ජාතික විෂයමාලා රාමුව, අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ජාතික තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතිපත්ති පනත් කෙටුම්පත, අධ්‍යාපනයට අදාළ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාව, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාව, පාසල්වල උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව ලෙස වසර 13 ක සහතික කළ අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම (2023), ළමුන්ගෙන් සමන්විත ධාර්මික සමාජයක් ගොඩනැගීම සඳහා සියලු ආගම්වල විෂයයන් වන ආගම් විෂය නිර්දේශ සඳහා සංශෝධන හඳුන්වා දීම (2023), අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය සඳහා වන ප්‍රතිපත්තිය (2023), තෝරාගත් පාසල් පාසල් දැනට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන පාසල්වලින් ජාතික පාසල් මට්ටමට උසස් කිරීම මගින් ජාතික පාසල් සංඛ්‍යාව 1,000 දක්වා වැඩි කිරීම (2023), ශ්‍රී ලාංකික සුදුසුකම් රාමුව (SLQF) පිළිගැනීම (2023) (ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව, 2023) යන විශේෂිත ලේඛනවල නිර්දේශ යොමු කර ඇත.

ශ්‍රී ලංකා අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව 2023-2033 රටේ අධ්‍යාපන ක්‍රමය පරිවර්තනය කිරීමට ඉවහල් වේ. මෙම රාමුව අධ්‍යාපනික ප්‍රතිඵල වැඩිදියුණු කිරීමට සහ අනාගත අවශ්‍යතා සමඟ සමපාත වීමට ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ අනුව,

1. සමානාත්මතාවය සහ ප්‍රවේශය (Equity and Access) : සියලුම සිසුන්ට ඔවුන්ගේ සමාජ-ආර්ථික පසුබිම නොසලකා සමාන අධ්‍යාපන අවස්ථා සැපයීම, නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ හරහා ඇතුළත් වීම සහ ප්‍රවේශය සහතික කිරීම එහි අරමුණයි.

2. විෂයමාලා සහ ඉගැන්වීම් ප්‍රතිසංස්කරණ (Curriculum and Teaching Reforms) : රාමුව ඩිජිටල් කුසලතා සහ විවේචනාත්මක චින්තනය ඇතුළත් කිරීම සඳහා විෂය මාලාව නවීකරණය කිරීම අවධාරණය කරයි. ඉගැන්වීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ගුරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ද ඇතුළත් වේ.

3. යටිතල පහසුකම් සහ සම්පත් (Infrastructure and Resources) : හිතකර ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පාසල් පහසුකම් වැඩිදියුණු කිරීම සහ තාක්ෂණයට ප්‍රවේශය පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

4. විමධ්‍යගත කිරීම සහ පරිපාලනය (Decentralization and Administration) : පරිපාලනය විධිමත් කිරීම සඳහා, පාසල් පද්ධතිය පොකුරු වශයෙන් ප්‍රතිසංවිධානය කිරීම සහ වඩා හොඳ කළමනාකරණයක් සඳහා පාසල් මණ්ඩල සහ කලාප කාර්යාලවල කාර්යභාරය ඉහළ නැංවීම සඳහා රාමුව යෝජනා කරයි.

5. ඇගයීම සහ තත්ත්ව සහතිකය (Assessment and Quality Assurance) : අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ ප්‍රතිඵල සහතික කිරීම සඳහා වඩාත් ශක්තිමත් ඇගයීම් සහ අධීක්ෂණ පද්ධති හඳුන්වා දීම.

6. වෘත්තීය සහ උසස් අධ්‍යාපනය (Vocational and Higher Education) : රටේ ආර්ථික ඉලක්ක සමඟ පෙළ ගැසීමට සහ තරුණ විරැකියාව අවම කිරීමට වෘත්තීය පුහුණුව සහ උසස් අධ්‍යාපනය පුළුල් කිරීම.

මෙම ප්‍රතිපත්තිය ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයකට සිසුන් සූදානම් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් 2048 වන විට පූර්ණ සංවර්ධිත රටක් බවට පත්වීම ශ්‍රී ලංකාවේ අනාගත දැක්ම වේ.

ශ්‍රී ලංකාවේ මෑතකාලීන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (NEPF) 2023-2033 අධ්‍යාපන ක්‍රමය නවීන අවශ්‍යතා සහ අභියෝගවලට මුහුණදීම සඳහා පරිවර්තනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දී ඉතා වැදගත් කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කර තිබේ. එහිදී, ඩිජිටල් යුගය සහ ගෝලීය රැකියා වෙළඳපොළ සඳහා සිසුන් සූදානම් කිරීමට විෂයමාලා යාවත්කාලීන කිරීම, සමාජ-ආර්ථික තත්ත්වය, වාර්ගිකත්වය හෝ ආබාධිතභාවය නොසලකා සැමට ප්‍රවේශ විය හැකි අධ්‍යාපනයක් ඇති කිරීම, වැඩිදියුණු කළ ගුරු පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම, ගෝලීය ප්‍රගතිය සමඟ සීග්‍රයෙන් ඉදිරියට යාමට සහ අවශ්‍ය ඩිජිටල් කුසලතා සිසුන්ට ලබාදීම සඳහා අත්‍යවශ්‍ය වන ඩිජිටල් මෙවලම් සහ තාක්ෂණය අධ්‍යාපනය තුළ ඒකාබද්ධ කිරීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම මෙම මෑතකාලීන ප්‍රතිපත්ති රාමුවෙහි හඳුනාගත හැකි යහපත් ලක්ෂණයන්ය.

නමුත් මෙම ජාතික ප්‍රතිපත්ති රාමුව සකස් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් පැවතිය ද ඉන් බැහැරව කටයුතු කිරීම සම්බන්ධයෙන් වර්තමානයේ දී මතවාදීමය තත්ත්වයක් මතු ව පවතී. මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී විශේෂයෙන් සීමිත සම්පත් සහ යටිතල පහසුකම් සහිත ප්‍රදේශයන්හි දරුවන් කෙරෙහි අවධානය යොමු කල යුතු ය. තවද,

සමස්තයක් වශයෙන්, NEPF ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ සැලකිය යුතු වර්ධනයක් ඇති කිරීමට ඉලක්ක කරයි, එහි සාර්ථකත්වය රඳා පවතින්නේ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ හඳුනාගත් දුර්වලතා ආමන්ත්‍රණය කිරීම මඟිනි.

ඩිජිටල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම මෙහි එක් අරමුණක් වන අතර, අඩු පහසුකම් ඇති හා ග්‍රාමීය ප්‍රදේශවල සිසුන් බාධාවකින් තොරව ඩිජිටල් අධ්‍යාපනයට ප්‍රවේශ වන්නේ කෙසේද යන්න ආමන්ත්‍රණය කර නොමැති වීම මෙහි හඳුනාගත හැකි දුර්වලතාවය කි. ජාතික අධ්‍යාපන රාමුවේ සාර්ථකත්වය ප්‍රමාණවත් අරමුදල් මත දැඩි ලෙස රඳා පවතී. ශ්‍රී ලංකාවේ ආර්ථික අභියෝග හමුවේ, එවැනි අභිලාෂකාමී ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රමාණවත් සම්පත් ලබා ගැනීම දුෂ්කර විය හැකිය. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ. විවේචකයින් තර්ක කරන්නේ, විශේෂයෙන්ම ඩිජිටල් සාක්ෂරතාව සහ අධ්‍යාපනය තුළ AI ඒකාබද්ධ කිරීම වැනි ක්ෂේත්‍රවල රාමුවේ ඇතැම් විට එහි ඉලක්ක සපුරා ගැනීම සඳහා සවිස්තරාත්මක උපාය මාර්ග නොමැති බවයි.

සමස්තයක් වශයෙන්, NEPF ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ සැලකිය යුතු වර්ධනයක් ඇති කිරීමට ඉලක්ක කරයි, එහි සාර්ථකත්වය රඳා පවතින්නේ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ හඳුනාගත් දුර්වලතා ආමන්ත්‍රණය කිරීම මඟිනි. සමස්තයක් ලෙස ගත කල ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සියලු පුරවැසියන් සඳහා ගුණාත්මක මෙන්ම නොමිලේ සාධාරණ ප්‍රවේශයක් ලබාදීම අවධාරණය කරයි. මෙහිදී අධ්‍යාපන ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම, ගුරු පුහුණුව වැඩිදියුණු කිරීම සහ ඉගැන්වීමේ සහ ඉගෙනුම් ක්‍රමවල නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම එහි අරමුණ වී තිබේ. එසේම ප්‍රතිපත්තිය සියලුදෙනා අන්තර්ගත වූ අධ්‍යාපනය, තාක්ෂණ ඒකාබද්ධ කිරීම සහ ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා කෙරෙහි අවධානය යොමු කර තිබේ. මීට අමතරව, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ අතර විෂමතා අවම කිරීම සහ නවීන ලෝකයේ අවශ්‍යතා සපුරාලීම සඳහා අධ්‍යාපනයේ අදාළත්වය වැඩි දියුණු කිරීම වැනි අභියෝගවලට විසඳුම් සෙවීම එහි අරමුණයි. අනෙක් අතට අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් මගින් සිසුන් සහ අධ්‍යාපනඥයින් අතර ඩිජිටල් සාක්ෂරතා කුසලතා වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. මෙම වැඩසටහන මගින් ගුරුවරුන්ට ඔවුන්ගේ ඉගැන්වීම් ක්‍රම සහ විෂයමාලාවට තාක්ෂණය ඒකාබද්ධ කිරීම පිළිබඳ පුහුණුවක් ලබාදීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ. විශේෂයෙන් ග්‍රාමීය සහ අඩු පහසුකම් සහිත ප්‍රදේශවල සිසුන්ට ඩිජිටල් උපාංග සහ අන්තර්ජාල සම්බන්ධතා සඳහා ප්‍රවේශය ලබා දීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ. මීට අමතරව, අනාගතයේ තරගකාරී ඩිජිටල් යුගයේ සාර්ථකත්වය සඳහා, අවශ්‍ය විවේචනාත්මක චින්තනය, ගැටළු විසඳීම සහ ඩිජිටල් පුරවැසිභාවය පිළිබඳ කුසලතා වර්ධනය කිරීමට සිසුන්ට උපකාර කිරීම සඳහා අවධානය යොමු කිරීම යන යෝජනා ඉදිරිපත් කළ හැකිය. කෙසේ නමුත් අනාගත පරම්පරාවේ අභිවෘද්ධිය උදෙසා ඇති කරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් වඩා හොඳ සමාජ, ආර්ථික, දේශපාලන හා පාරිසරික වටපිටාවක් ඇතිවීම රටක් වශයෙන් අප ලබන භාග්‍යයකි.

**කේ.ජී. රංගනී ලක්මාලි**
**වැඩසටහන් සම්බන්ධීකාරිනී,**
**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**

# ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය සහ සමසාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන සංවර්ධන සන්ධානය නව ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලබයි

EDUCATIONOUTLOUD
advocacy & social accountability

GPE Transforming Education

CED Sri Lanka
Quality Education For All

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වසර ගණනාවක් පුරා කැප වී ක්‍රියාකරන අධ්‍යාපන සංවර්ධන සන්ධානය තම මෙහෙවර තවදුරටත් ඉදිරියට ගෙන යමින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්තීන් සම්පාදනය කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීමට සිවිල් සමාජ දායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා නව ව්‍යාපෘතියක් මෙම වසරේ සිට ක්‍රියාවට නංවනු ඇත. මෙම නව ව්‍යාපෘතියේ කාලසීමාව වසර තුනක් වේ. ව්‍යාපෘතියට අරමුදල් සපයනු ලබන්නේ අධ්‍යාපනය සඳහා වූ ගෝලීය පාර්ශවකරණය (GPE) වන අතර අරමුදල් කළමනාකරණ කටයුතු ඔක්ස්ෆෑම් IBIS ආයතනය මගින් සිදුකරනු ඇත.

මෙම නව ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ **ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ සමානාත්මතාවය ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ විෂයය මාලාවන්හි අදාළත්වය සහතික කරගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති සංවර්ධනය, ක්‍රියාවට නැංවීම සහ අධීක්ෂණය සඳහා සිවිල් සමාජ සංවිධාන ශක්තිමත් කිරීමය.**

එහි විශේෂිත අරමුණු පහතින් සඳහන් වේ.

1. ජාතික සහ පළාත් මට්ටමේ අධ්‍යාපන ප්‍රතිපත්ති සංවර්ධනයේදී අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ මැදිහත්වීම වර්ධනය වීම සහ පිළිගැනීමට ලක්වී තිබීම.
2. අධ්‍යාපන ප්‍රතිපත්ති ජාතික හා පළාත් මට්ටම්වලදී කාර්යක්ෂමව සහ ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක වීම සඳහා ප්‍රජා සහභාගිත්වය දිරිගැන්වීම.
3. අධ්‍යාපන අංශයේ ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීමේ ක්‍රියාවලියේදී අධ්‍යාපන අධිකාරීන් සහ සිවිල් සංවිධාන අතර සහයෝගීතාවය තිරසර වීම.

මෙම අරමුණු දිනාගැනීම සඳහා ජාතික පළාත් සහ දිස්ත්‍රික්ක වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ක්‍රියාකාරකම් ගණනාවකින් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ. මෙම අරමුණු අතරින් පළමුවැනි අරමුණ දිනාගැනීමේදී අපගේ සාමාජික සංවිධාන ඇතුළුව සිවිල් සමාජ සංවිධාන ඉලක්ක කරගත් ධාරිතා සංවර්ධන සහ පුහුණු වැඩසටහන් විශේෂයෙන් වැදගත් වේ. අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජික සංවිධානයන්හි, ධාරිතාවයන් හා ශක්තීන් පිළිබඳව තක්සේරු කිරීමේ අධ්‍යයනයක් ද මෙහිදී පළමුවෙන් සිදු කිරීමට අපේක්ෂිතය. එමගින් සාමාජික සංවිධාන තවදුරටත් සංවිධානයක් වශයෙන් ශක්තිමත් කිරීම සඳහා වන වඩාත්ම සුදුසු වැඩසටහන් සැළසුම් කරගැනීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීම මෙමගින් අපේක්ෂා කරනු ලැබේ. එමෙන්ම අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඔවුන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් මාලාවක් සැලසුම් කර තිබෙන අතර මෙමගින් අධ්‍යාපන ප්‍රතිපත්තීන් සැකසීම, ක්‍රියාවට නැංවීම සහ අධීක්ෂණය පිළිබඳව මනා දැනුමක් ඔවුන් තුළ ගොඩ නැංවීමටත් ස්ථාපිත කිරීමටත් අපේක්ෂා කරනු ලැබේ. මෙමගින් අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජික ජාලය තවදුරටත් ශක්තිමත් කිරීමට හැකිවනු ඇත. දැනුමින් සහ කුසලතාවයන්ගෙන් පරිපූර්ණ සාමාජික ජාලයක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අර්ථාන්විත දායකත්වයක් ලබාදීමට සමත්වනු ඇතැයි මෙහිදී අපේක්ෂා කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතියේ දෙවන විශේෂිත අරමුණ දිනාගැනීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධාන අංගවන නව අධ්‍යාපන උපනතීන් සැමට අධ්‍යාපන සංකල්පය අධ්‍යාපන මූල්‍යකරණය සහ අධ්‍යාපනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාලගුණ වෙනස්වීම් පිළිබඳ අධ්‍යාපනය වැනි තේමාත්මක අංගයන් පිළිබඳව සාමාජික සංවිධානවල දැනුම්වත්භාවය වර්ධනය කිරීමට මෙහිදී අපේක්ෂා කෙරේ. මෙම අංශයන් ඉලක්ක කරගත් ධාරිතා සංවර්ධන වැඩසටහන් රාශියක් ව්‍යාපෘති කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. ඉහත තේමාවන් මූලික කරගෙන සකස්කර තිබෙන ජාතික සහ පළාත් මට්ටමේ ප්‍රතිපත්තීන් සහ වැඩසැලසුම් පළාත් මට්ටමේදී නිසි ආකාරයෙන් ක්‍රියාවට නැංවීමටත්, ඒ සඳහා සිවිල් සමාජ දායකත්වය ලබාදීමටත් මෙමගින් හැකිවනු ඇත.

එමෙන්ම නව ව්‍යාපෘතියේදී වැඩි අවධානයක් අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම සඳහා උද්දේශන කිරීමට අපේක්ෂා කරන බැවින් සාමාජික සංවිධානයන්හි උද්දේශන හැකියාවන් තවදුරටක් නංවාලීම සඳහා සැකසුණු වැඩසටහන් ද මෙහි අඩංගු වී ඇත. මේ අනුව ඔබට බලපෑම් කිරීමට අවශ්‍ය තේමා පිළිබඳව ඔබේ සංවිධානය තුළ පූර්ණ දැනුමක් තිබේද? උදාහරණ වශයෙන් අප උද්දේශන සිදුකරන්නේ අධ්‍යාපනය සඳහා මුදල් වෙන් කිරීම පිළිබඳව නම් ඒ පිළිබඳව

උද්දේශන සිදුකළ හැකි ආකාරයන් සහ ඉලක්ක කළ යුතු කණ්ඩායම් පිළිබඳව, මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ ජාතික අධ්‍යාපන වැඩ සැලසුම් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්නේ කෙසේදැයි ඔබ දන්නවාද? සිවිල් සමාජ ජාල සහ උපායමාර්ගික හවුල්කාරිත්වයන් සම්බන්ධයෙන් ඔබ හොඳින් සම්බන්ධ වී සිටිනවාද? වැනි කරුණු සම්බන්ධයෙන් මෙහිදී අවධානය යොමු කිරීමට අපේක්ෂා කරන අතර මෙම උද්දේශන පළාත් සහ ජාතික මට්ටමෙන් සිදු කිරීමට අපේක්ෂිත ය.

**මෙම නව ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ සමානාත්මතාවය ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ විෂයය මාලාවන්හි අදාළත්වය සහතික කරගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති සංවර්ධනය, ක්‍රියාවට නැංවීම සහ අධීක්ෂණය සඳහා සිවිල් සමාජ සංවිධාන ශක්තිමත් කිරීමය.**

13 වැනි ව්‍යවස්ථා සංශෝධනය යටතේ, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය විමධ්‍යගත විෂයයක් බැවින් පළාත් සභාවන්ට අධ්‍යාපනයේදී විශේෂ බලතල හිමිවේ. එබැවින් වැඩසටහනේ ක්‍රියාකාරකම් වැඩි ප්‍රමාණයක් පළාත් මට්ටමින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කරන අතර මේ සඳහා සාමාජික සංවිධානයන්හි මූලිකත්වය යටතේ, පළාත් අධ්‍යාපන කමිටු පිහිටුවීමට කටයුතු කරනු ඇත. මෙම පළාත් කමිටු අදාළ පළාතේ අධ්‍යාපන බලධරයන් සමග සහයෝගයෙන් සහ සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක වනු ඇත. මේවායේ ප්‍රධාන කාර්යයභාරය වන්නේ පළාතේ අධ්‍යාපනය සම්බන්ධයෙන් වන ගැටලු හඳුනා ගැනීමටත්, ඒවාට ප්‍රතිපත්තිමය මට්ටමේ විසඳුම් ලබාදීම සඳහා සහාය වීමටත් බලපෑම් කිරීමත් ය.

මේ සඳහා පිහිටුවනු ලබන පළාත් අධ්‍යාපන කමිටුව අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජික සංවිධානවල සාමාජිකයින්ගෙන් පමණක් නොව ඔවුන් විසින් නිර්දේශ කරනු ලබන අධ්‍යාපන ක්ෂේත්‍රයේ හෝ පළාතේ අධ්‍යාපනය වෙනුවෙන් උනන්දුවක් දක්වන අනෙකුත් සිවිල් පුරවැසියන්ගෙන්ද, සමන්විත වනු ඇත. මෙවැනි ශක්තිමත් කමිටුවක් මගින් පළාතේ අධ්‍යාපන බලධාරීන් සමගින් සම්බන්ධීකරයෙන් යුතුව කටයුතු කිරීමටත්, ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීමටත් හැකි වේ.

මෙම උද්දේශනයන් සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා ඒවාට අවශ්‍ය මූලික දත්ත තොරතුරු ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකභාවයෙන් ඉහළ මට්ටමින් ලබාගත යුතුවේ. සාක්ෂි පදනම් කරගත් උද්දේශන ක්‍රියාවලියකට විශ්වාසයෙන් යුතුව යොමුවීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමට සමීක්ෂණ, පර්යේෂණ සහ අධ්‍යයන ගණනාවක් මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකිරීමට අපේක්ෂා කරනු ලැබේ. මෙම තොරතුරු අනෙකුත් සංවිධාන සහ අධ්‍යාපන විෂයය හා සම්බන්ධ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන ආයතන පුද්ගලයින් සමග බෙදාගැනීමට සැලසුම් කර තිබේ. ඒ අනුව සමාජයේ අනෙකුත් විවිධ කණ්ඩායම් සමගින්ද, එක්වී කටයුතු කිරීමට අපේක්ෂා කරන අතර මෙහිදී මාධ්‍යවේදීන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් හා තරුණ ප්‍රජාවට විශේෂ අවධානයක් යොමුවනු ඇත.

2023 වසරේදී රජය විසින් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලියක් හඳුන්වා දුන් අතර මෙයට 2023 සැප්තැම්බර් මාසයේදී කැබිනට් අනුමැතිය හිමිවිණි. අනාගතයේ සිදුකරණු ලබන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදී මෙය පදනමක් වශයෙන් යොදාගන්නා බව රජය දැනුම්දී තිබෙන අතර මෙම යෝජනාවලිය සම්බන්ධයෙන් අධ්‍යාපන සංවර්ධන සන්ධානය 2024 අප්‍රියෙල් මාසයේදී තම නිරීක්ෂණ ඉදිරිපත් කළ අතර ඒම නිරීක්ෂණ අධ්‍යාපන අමාත්‍යාංශය දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන සහ මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ විවිධ පාර්ශවයන් වෙත ඉදිරිපත් කරන ලදී.

යම් ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීමේදී එහි සාර්ථකත්වය සඳහා රටේ පවතින වාතාවරණය සහ ප්‍රමුඛතාවය විශේෂයෙන් වැදගත් වේ. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නව යෝජනා ඉදිරිපත් වී ඇති මෙම අවස්ථාව අපගේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට වඩාත් උචිත වාතාවරණයක් සැකසී ඇති බව මෙහිදී ඉතාමත් හොඳින් පැහැදිලි වේ.

පොදුවේ අධ්‍යාපන විෂයය සම්බන්ධයෙන් ජනතාව තුළ උද්යෝගයක් සහ උනන්දුවක් ඇති කිරීම සඳහාත්, ඔවුන්ගේ අර්ථාන්විත සහභාගිත්වය ලබාගැනීම සඳහාත්, අධ්‍යාපනය හා සම්බන්ධ ජාතික සහ අන්තර්ජාතික වශයෙන් වැදගත් අවස්ථාවන්හිදී විශේෂ ව්‍යාපාර හා දැනුම්වත් කිරීම් සිදුකිරීමටත්, කටයුතු කරන අතර මේවා පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාවට නැංවෙනු ඇත. ඒ අතරම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැනි ජාතික වශයෙන් වැදගත් වන අවස්ථාවන් පිළිබඳව ජනතාව තුළ කතිකාවක් ඇති කිරීම සඳහා වූ, විශේෂ මැදිහත්වීම් ද මේ සමගින් සැලසුම් කර තිබේ. මේ සඳහා විවිධ ක්‍රමෝපායයන් භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

මූලික වශයෙන් ඉහතින් සඳහන් කරන ලද ක්‍රමෝපායයන් සහ මැදිහත්වීම් තුළින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ ඵලදායී බව ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්තිමය වෙනස්කම් ඇතිකිරීමේදී, එයට සිවිල් සමාජ දායකත්වය ලබාගැනීමේ වැදගත්කම පිළිබඳව බලධාරීන් දැනුම්වත් කිරීමටත්, අවසාන වශයෙන් රටට වඩාත් ඵලදායී අධ්‍යාපන ප්‍රතිපත්තීන් සම්පාදනය කර, ඒවා ප්‍රායෝගික මට්ටමින් ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමටත් මෙමගින් හැකිවනු ඇතැයි අධ්‍යාපන සංවර්ධන සන්ධානය දැඩි විශ්වාසයෙන් පසුවේ.

අධ්‍යාපන සංවර්ධන සන්ධානය.




ඡායාරූපය හරින් ජයසිංහ

# ආපදා කළමනාකරණ උපායමාර්ග සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය

'ශ්‍රී ලංකාව ස්වභාවික ආපදා තත්ත්වයන්ගෙන් තොර, සුරක්ෂිත රටක් බව' අතීතයේ දී අප අතර අදහසක් පැවැති නමුත් පසුගිය දශක තුනක පමණ කාලයක සිට විශේෂයෙන් කාලගුණික වෙනස්වීම් පදනම් කරගත් විවිධ ආකාරයේ ආපදාවන්ට නිරන්තරයෙන් මුහුණු දෙන වාතාවරණයක් වර්තමානයේ ඇති වී තිබේ. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම මත අප භූමිකම්පා සහ ගිනිකඳු වැනි ස්වභාවික ව්‍යවසනයන්ට ලක් නොවන නමුත් අනෙක් අතට අප රට ඝර්ම කලාපීය රටක් වන බැවින් ඉන්දීය සාගරයේ නිරන්තරයෙන් ඇතිවන විවිධ කාලගුණික වෙනස්වීම් මත සෘජු හෝ වක්‍ර බලපෑමට ලක් වේ. මේ අනුව අධික වර්ෂාව, ජලගැලීම්, නායයාම් වැනි ආපදා තත්ත්වයන්ට අපට බහුලව අපට මුහුණදීමට සිදුවේ. 2022 වසරේ ගෝලීය කාලගුණික අවදානම් දර්ශකයේ අතිශයින් අවදානම්කාරී කාලගුණික බලපෑම් ඇතිවන රටවල් 10 න් එකක් ලෙස, ශ්‍රී ලංකාව හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාව කාලගුණික හා දේශගුණික වෙනස්කම් සම්බන්ධයෙන් වූ අන්තර්ජාතික ප්‍රඥප්තීන් අනුව කටයුතු කරනු ලබයි. 1993 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ වැඩ සැලැසුම් සම්මුතිය (NFCCC) අනුමත කරන ලද අතර 2002 සැප්තැම්බර් මාසයේදී එහි Kyoto මූලපත්‍රයටද එකඟතාව පළ කරන ලදී. ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රධාන වගකිවයුතු ආයතනය වන්නේ ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන යයි. 2004 වසරේ ඇතිවූ සුනාමි තත්ත්වයෙන් පසුව, විවිධ පාර්ශවයන්ගෙන් සැදුම්ලත් ආපදා කළමනාකරණ කාර්යක්ෂම යාන්ත්‍රණයක අවශ්‍යතාවය, දැඩි ව දැනුනු අතර මේ  සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත යටතේ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. ආපදා තත්ත්වය තුළ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත බලය සහ විධායක බලතල ඇත. 2010 දී අනුමත කරන ලද ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික ප්‍රතිපත්තියේ සහ සාමූහික ප්‍රතිචාර අංශය යටතේ එහි සඳහන් කර ඇත්තේ පුද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන, ජාතික සහ පළාත් මට්ටමින් අදාළ රාජ්‍යය ආයතන සමඟ සමීප සම්බන්ධීකරණයෙන් ආපදා කළමනාකරණ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු බවයි.

දේශගුණික විපර්යාස මගින් එල්ල වන අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් ක්‍රියාමාර්ග රැසක් අනුගමනය කර ඇති අතර ජාතික දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය (2012), 2010 දී ශ්‍රී ලංකාව සඳහා ජාතික දේශගුණික විපර්යාස අනුවර්තන උපායමාර්ගය වැනි ජාතික ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ක්‍රියාමාර්ග මේ සම්බන්ධයෙන් ගනු ලැබූ වැදගත් පියවර කිහිපයක් ලෙස සැලකිය හැකිය.  මේවාට සමගාමීව 2016 දී ආපදා කළමනාකරණය සම්බන්ධයෙන්, ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන්  ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සඳහා සහාය වනු පිණිස, ශ්‍රී ලංකාව 2016-2019 ආපදා සඳහා සූදනම් සැලසුම (Readiness Plan) සම්පාදනය කරන ලදි. ජාතික වශයෙන් නිර්ණය කළ දායකත්වයන් NDC සාක්ෂාත් කරගැනීමට සඳහා අවශ්‍ය වන පූර්ව අවශ්‍යතා පහසුකම් සැලසීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග, එහි සවිස්තරාත්මකව දක්වා තිබුණි. අනපේක්ෂිත අන්තරායකර සිදුවීම් හේතුවෙන් ප්‍රජාවක හෝ සමාජයක මානව, ද්‍රව්‍ය, ආර්ථික හා පාරිසරික අලාභ හා හානි සිදුවීමෙන් එහි ක්‍රියාකාරිත්වයට බරපතල බාධාවක්, ඇති වන තත්ත්වයක් ආපදා තත්ත්වයක් යනුවෙන් සරලව හැඳින්විය හැකිය. මෙවැනි




*Sources : Disaster Management Centre.*

අවස්ථාවකදි ප්‍රදේශයේ පවතින සම්පත් භාවිතා කරමින් එම බලපෑම් තත්ත්වයක් කළමනාකරණය කරගැනීමට අදාළ ප්‍රජාවකට නොහැකි වාතාවරණයක් ඇතිවිය හැකියි. එවැනි අවස්ථාවක බාහිරින් සහාය පැතීමට සිදුවේ. එසේ නමුත් බාහිර සහාය ලබාග ැනීමට නොහැකි තත්වයන් ද ඇතිවිය හැකියි. මෙවැනි තත්වයක් හමුවේ වඩාත් වැදගත් වන සංකල්පයන් දෙකක් වන්නේ ආපදා කළමනාකරණය සහ ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග යන් ය. මෙම ක්‍රියාකාරකම් දෙකම සඳහා පෙර සූදානම් වීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ජාතික ආපදා කළමනාකරණය යාන්ත්‍රණයට අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ රජයේ වෙනත් ආයතන ගණනාවක් අයත් වේ. මෙහි ප්‍රධානතම ස්ථානය ගනු ලබන්නේ ජාතික ආපදා කළමනාකරණ සභාව වන අතර මෙය ජනාධිපතිතුමාගේ හා අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සකස් වී ඇති අතර පළාත් නවයේම ප්‍රධාන අමාත්‍යවරුද මෙයට ඇතුළත් වේ. ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් තනිව එක් ආයතනයකට පමණක් වගකීම ගත නොහැකි අතර මේ සඳහා විවිධ අංශ අතර මනා සම්බන්ධීකරණය අත්‍යවශ්‍ය වේ.

අධ්‍යාපනික අංශයේ ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රධාන වගකීමක් අධ්‍යාපන අමාත්‍යාංශයට සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවලට හිමි වේ. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු සමගින් සහයෝගයෙන් හා සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක වීම සහ පාසල් ආපදා කළමනාකරණ කමිටු පිහිටුවීම මෙහිදී වැදගත් වේ. මෙම කමිටු රාජ්‍ය නිලධාරීන් සහ එම ආයතනවල නියෝජිතයින්ගෙන් පමණක් නොව සිවිල් සමාජ නියෝජිතයින්ගෙ න්ද සමන්විත විය යුතු නමුත් එවැනි තත්ත්වයන් දැනට ප්‍රායෝගිකව දක්නට නොමැත. එසේම අධ්‍යාපන අමාත්‍යාංශය සහ මේ හා සම්බන්ධිත වෙනත් ආයතන අතර අන්තර් අමාත්‍යාංශ සහයෝගිතාව සහ සම්බන්ධීකරණය දැනට ඉතා සීමිත මට්ටමක පවතී .පසුගිය වසර 100 ක කාලය තුළ ශ්‍රී ලංකාවේ කිසියම් හෝ ප්‍රදේශයකින් වාර්තා වූ වැඩිම වර්ෂාපතනය මෙම වසරේදී කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර, එහි අගය මිලි මීටර් 410 ක් විය. දිවයිනේ දිස්ත්‍රික්ක 10කට අධික ප්‍රමාණයකට බලපෑ මෙම තත්ත්වය හේතු කොටගෙන දින දෙකක් සම්පූර්ණයෙන් පාසල් වසා දැමීමට රජය පියවර ගත් අතර, මේ අනුව ළමුන් ලක්ෂ හතලිහකට දින දෙකක් අධ්‍යාපනය ලැබීමේ වරම් අහිමි විය. මෙයට අමතරව, තවත් ප්‍රදේශ ගණනාවක පාසල් ගණනාවක් මෙයට වඩා වැඩි දින ගණනාවක් වසා දැමීමට සිදුවුණ අතර මෙමගින් අධ්‍යාපනයට සිදු වූ බලපෑම අතිවිශාලය. මාර්ග අවහිරතා, පාසල් ගොඩනැගිලි විනාශ වීම, පොත්පත් සහ වෙනත් අධ්‍යාපනික ආධාරකවලට හානිවීම මෙහිදී සෘජුවම අධ්‍යාපනයට බාධාකාරී තත්ත්වයන් ගෙන දුන් අතර මෙයට අමතරව පාසල් සහ අදාළ ගොඩනැගිලි ආපදාවට පත් වූ ආසන්න ප්‍රදේශයේ ප්‍රජාවට නවාතැන් පහසුකම් සහ ඔවුන්ගේ වෙනත් අවශ්‍යාතා සපුරාලීම වෙනුවෙන් වෙන් කිරීමට සිදුවීම මත ද්විතීයික බලපෑමක් ද ඇතිවේ. මේ අන්දමින් ආපදාවන්ට ලක්වීම තුළින් අධ්‍යාපනයට සිදුවන බලපෑම අවම කිරීම සහ රජය ඇතුළුව විවිධ සංවිධාන හා ආයතන ගණනාවක් විවිධාකාරයේ ප්‍රතිචාර දැක්වීම්වල නිරතව සිටී. හානි වූ පොත්පත් ලබාදීම, වෛද්‍ය ප්‍රතිකාර, ආධාර මුදල් සැපයීම, බෑග් සපත්තු නිලඇඳුම් වැනි දේ සැපයීම මේ අතර වේ. එසේ නමුත් මෙහිදී කණගාටුවට කරුණක් වන්නේ සෑම වසරකම මෙවැනි ආපදා තත්ත්වයන්ට මුහුණදීමට මෙම පාසල් ප්‍රජාවට සිදුවීමත් ඒ සම්බන්ධයෙන් කල් පවත්නා ස්ථාවර විසඳුමකට එළඹීමට තවමත් අප අපොහොසත්වී තිබීමත්ය.

උදාහරණ වශයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර නගරය ආශ්‍රිත පාසල් මුහුණදෙන තත්වයන් සලකා බැලිය හැකිය. මෙම පාසල් සෑම වසරකම පාහේ එම ප්‍රදේශයේ ඇතිවන ජලගැලීම්වල අහිතකර බලපෑම්වලට ලක්වේ. එසේ නමුත් මේ සඳහා තිරසාර විසඳුමක් ලබාදීමට තවමත් බලධාරින් සමත්ව නැත. ආපදා අවස්ථාවකදී සියලු සේවාවන් හා පහසුකම් ලබාදීම යම් ආයතනයකට තනිවම සිදු කළ හැක්කක් නොවේ. කොතරම් පහසුකම් සහ සම්බන්ධීකරණයක් පැවතුනද ඇතිවන ආපදා තත්ත්වයන් හා විනාශයේ ප්‍රබලතාවයේ තීව්‍රත්වය මත මෙම සේවාවන් සැපයීම අඩාල විය හැකියි. ආපදා තත්ත්වයන්හිදී එයට පළමුව ප්‍රතිචාර දැක්වීමට හැකි වනුයේ බලපෑමට ලක්වූ ප්‍රජාවේ සාමාජිකයන්ටය.

පාසල් ආපදා කළමනාකරණ කමිටු පිහිටුවීම මෙහිදී වඩාත් වැදගත් වන්නේ ඒවා මගින් ආපදා පිළිබඳව දැනුම්වත් කිරීමත් පෙර සූදානම් කිරීමත් සිදු කළ හැකි බැවිනි. 2007 වසරේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රජයේ පාසල්වල, පාසල් ආපදා කළමනාකරණ කමිටු පිහිටුවීම ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, මෙම කමිටු නාමික වන අතර, ඵලදායී ලෙස ක්‍රියාත්මක නොවන බව සඳහන් කළ යුතුය. පාසැලේදී, ඔවුන්ගේ ප්‍රාදේශීය ප්‍රජාව තුළ සහ ඉන් ඔබ්බට දේශගුණික විපර්යාස බලපෑම් අවම කිරීම සඳහා නිශ්චිත ක්‍රියාමාර්ග ගැනීමට සහ වෙනස් කිරීමේ නියෝජිත භූමිකාවන් ඉටු කිරීමට සිසුන්ට අවස්ථා, වේදිකාවන් සහ වේදිකා ලබා දීම මෙහිදී විකල්ප වශයෙන් සිදු කළ හැකියි.

> **දිවයිනේ දිස්ත්‍රික්ක 10කට අධික ප්‍රමාණයකට බලපෑ මෙම තත්ත්වය හේතු කොටගෙන දින දෙකක් සම්පූර්ණයෙන් පාසල් වසා දැමීමට රජය පියවර ගත් අතර, මේ අනුව ළමුන් ලක්ෂ හතලිහකට දින දෙකක් අධ්‍යාපනය ලැබීමේ වරම් අහිමි විය. මෙයට අමතරව, තවත් ප්‍රදේශ රැසක පාසල් ගණනාවක් මෙයට වඩා වැඩි දින ගණනක් වසා දැමීමට සිදුවුණ අතර මෙමඟින් අධ්‍යාපනයට සිදු වූ බලපෑම අතිවිශාලය.**

ආපදා කළමනාකරණය ක්‍රියාවලියෙහිදී අධ්‍යාපනයට විශාල බලපෑමක් සිදු කළ හැකිවේ. ශ්‍රී ලංකාවේ ආපදා තත්ත්වයන්ට දැඩි බලපෑමක් ඇති කරන කාලගුණික වෙනස්කම් පිළිබඳ අධ්‍යාපනය විධිමත් අධ්‍යාපන ක්‍රමයට අන්තර්ගත වන ප්‍රමාණය පිළිබඳව සලකා බැලීමේ දී සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලා කාලගුණික වෙනස්කම්වල මූලික කරුණු සහ දේශගුණික විපර්යාස සඳහා මානව ක්‍රියාකාකම්හි බලපෑම යනාදි මාතෘකා ප්‍රමාණවත් ලෙස ආවරණය නොකරන බව පෙනීයයි. මීට අමතරව, ශ්‍රී ලංකාව කාලගුණික වෙනස්කම් අධ්‍යයනය සඳහා විශේෂයෙන් මුදල් වෙන් කර නොමැත. ප්‍රාථමික අධ්‍යාපනයේ දී දරුවන්ට පරිසරය පිළිබඳ අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව ලබාදී ඇති නමුත්, පාරිසරික අධ්‍යයන විෂයයෙහි විෂයමාලාව වැඩි අවධානයක් යොමු කර ඇත්තේ අදාළ සාමාන්‍ය දැනුම කෙරෙහි වන අතර, මෙහිදී අනාගත අභියෝග සඳහා සූදානම් වීමට ඉඩ සලසන ගෝලීය හා ජාතික පරිසරයේ වර්තමාන තත්ත්වය පිළිබඳව ළමයින් දැනුවත් කිරීම ප්‍රමාණවත් ලෙස සිදු නොවේ. එමෙන්ම ද්විතීයික අධ්‍යාපනයේදීද භූගෝල විද්‍යාව, සමාජ අධ්‍යයනය සහ සෞඛ්‍යය වැනි විෂයයන්හිදී කාලගුණික වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කරන නමුත්, ඒ අංශයේ සමහර පැතිකඩවල් පිළිබඳව පමණක් කෙරෙහි අවධානය යොමුකර ඇත. විශේෂයෙන් ද්විතීයික මට්ටමේ දී මෙම කරුණ හා සම්බන්ධ හා අදාළ විෂය මාලා තිබුණද, දැඩි ලෙස විභාග කේන්ද්‍ර කරගත් ඉගැන්වීම සහ ඉගෙනීම යනු සිසුන්ට අදාළ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධන අවස්ථා නොමැති වීමයි. මෙම කරුණු මත ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනය යන කොටස් දෙකෙහිම ප්‍රමාණවත් අවධානයක් කාලගුණ වෙනස්කම් පිළිබඳව නොදක්වන බැවින් ළමුන් ඒ සඳහා යොමුවීමක් සිදුවන්නේ ඔවුන් ඇත්ත වශයෙන් නිසැකයෙන් මේ කෙරෙහි අවධානය දක්වනවා නම් පමණි. කෙසේවෙතත් ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය කාලගුණික වෙනස්කම් දේශගුණික විපර්යාස ඇතුළු පාරිසරික විද්‍යාවන් කෙරෙහි අවධානය යොමු කරන විවිධ උපාධි, සහ පශ්චාත් උපාධි පිරිනමයි. එහෙත් සියලු පුරවැසියන්ගේ දැනුම් සම්භාරයට ඇතුළත් විය යුතු විෂය ගැඹුරින් හැදෑරීමට අවස්ථාව ලැබෙන්නේ තරුණ පිරිසෙන් අතළොස්සකට පමණි. මෙම තත්ත්වයන් හේතු කොටගෙන 2020 වසරේ ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතය 92.3% ක් ලෙස සටහන් වුවද, බොහෝ දෙනෙකුට ඒ පිළිබඳව දැනුම්වත් කිරීමට අවශ්‍ය වේදිකා සපයා නොමැති බැවින් කාලගුණික සාක්ෂරතාව ඉතා දුර්වල මට්ටමක පවතී.

කාලගුණික වෙනස්කම් පිළිබඳ ප්‍රජාවේ අවධානය ඉහළ නැංවීමේදී එම විෂයය කේන්ද්‍ර කරගත් ගුරු පුහුණු අවස්ථා අතිශයින් වැදගත් වේ. ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ පවතින ගුරු කේන්ද්‍රීය සහ විභාග කේන්ද්‍ර කරගත් අධ්‍යාපනික භාවිතයන් ක්‍රියාවට නැඹුරු වූ සහ ප්‍රායෝගික කාලගුණික වෙනස්වීම් ඉගැන්වීම් සහ ඉගෙනීම ක්‍රියාවට නැංවීමට විශාල බාධාවකි. තිරසාර සංවර්ධන ඉලක්ක අංක 13 මගින් "දේශගුණික විපර්යාස සහ එහි බලපෑමට එරෙහිව සටන් කිරීම සඳහා හදිසි පියවර ගැනීම" අරමුණු කර ඇති අතර, මෙම ඉලක්කය ජයගැනීම සඳහා අධ්‍යාපනය මගින් අතිශය වැදගත් බලපෑමක් සිදුකළ හැකිවේ. කාලගුණික වෙනස්කම්හි බලපෑම් අවම කිරීම සහ අනුවර්තනය වීම සම්බන්ධයෙන් දැනුම, කුසලතා සහ ආකල්පමය ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම සඳහා පැහැදිලි විෂයමාලා සැකසීම ඉතා වැදගත් වේ. මේ අතර, COP 27 සමුළුවේදී ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා 2024 දී දේශගුණික විපර්යාස විශ්ව විද්‍යාලයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමේ අදහස යෝජනා කළේය. මෙමගින් ලොව පුරා සිටින විද්‍යාඥයින්, පරිසරවේදීන්, පර්යේෂකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, සංවර්ධන වෘත්තිකයින් සඳහා ඉඩකඩ සැලසේ" (CFC Sri Lanka, 2023). කාලගුණික වෙනස්කම් පිළිබඳව අපගේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව නැඹුරුවක් ඇති කිරීම සඳහා මෙය ධනාත්මක පියවරක් ලෙස සැලකිය හැකිය.

*අධ්‍යාපන සංවර්ධන සන්ධානය.*

# බුද්ධිමය දුබලතා සහිත හෙවත් සෙමෙන් මනස වැඩෙනවුන්ගේ අධ්‍යාපන අවශ්‍යතා



2012 වර්ෂයේදී කරන ලද සංගණනයකට අනුව ළමුන් 541,264 ක් බුද්ධිමය දුබලතා සහිත හෙවත් සෙමෙන් මනස වැඩෙන අය ලෙස හඳුනාගෙන ඇත. මෙම සංඛ්‍යාව මෙරට අවුරුදු 5 ට වැඩි ජනගහනයෙන් සියයට 2.9 කි.

සෙමෙන් මනස වැඩීම කෙරෙහි ප්‍රධාන වශයෙන් කරුණු හතරක් බලපානු ලැබේ.

1 ජානමය සාධක
2 පූර්ව ප්‍රසව සමයේ ඇතිවන බලපෑම්
3 ප්‍රසව අවස්ථාවේ හා
4 ප්‍රසවයෙන් පසු ඇතිවන බලපෑම් යනුවෙනි

සෙමෙන් මනස වැඩෙන දරුවන් හඳුනාගත හැක්කේ

- චිත්තවේගීය ගැටලු සහිතවීම
- සවන්දීමේ කුසලතා දුර්වලවීම
- අවධානය යොමුකිරීමේ ගැටලු සහිතවීම
- සාමාන්‍ය බුද්ධිය පහළ මට්ටමක පැවැතීම
- දැනුම කුසලතා පිළිබඳ ධාරණ ශක්තිය දුර්වල වීම
- භාෂාව අවබෝධ කරගැනීමේ දුෂ්කරතා පැවැතීම
- අඩු වචන මාලාවක් භාවිතා කිරීම
- සංකල්ප ග්‍රහණය කිරීමේ හැකියාව අඩුවීම
- ස්වයං කළමනාකරණ ඌණතාවය
- කියවීම භාවිතා කිරීමට නොහැකිවීම

යන කරුණු අනුවය.. සෙමෙන් මනස වැඩීමේ තත්වය පුලුල් පරාසයක පැතිර ඇති බැවින් අධ්‍යාපනය හා වෙනත් සේවා සැපයීමේදී ඔවුන් වර්ගීකරණය කර හඳුනාගත යුතුය. ඒ අනුව ක්‍රියාකාරී හැකියාවන් මත A,B,C යනුවෙන් සෙමෙන් මනස වැඩෙනවුන් කාණ්ඩ තුනකට වර්ග කෙරේ. ඒ ඒ කාණ්ඩ වෙන වෙනම හඳුනා ගැනීමෙන් ඔවුන්ගේ මානසික තත්ත්වයට සරිලන අධ්‍යාපන රටාවක් තෝරාගත හැකිය.

**A කාණ්ඩය**

- මෙම ළමයින්ගේ බුද්ධිමය ක්‍රියාකාරිත්වය අනුව අත්දැකීම් මතක තබාගැනීමට වෙනස් වෙනස් ද්‍රව්‍ය හඳුනාගැනීම හා සැසැඳීමේ හැකියාව සුලු වශයෙන් ඇත.
- කාලය හා අවකාශය සම්බන්ධයෙන් ඇත්තේ සීමිත සංකල්පයකි.
- වර්තමාන වටපිටාව තේරුම් ගැනීමට සහ ප්‍රතිචාර දැක්වීමට හැකිවුවත් ඊලගට සිදුවන දේ පිළිබඳව අවබෝධයක් නැත.
- සිතුවිලි සමග ක්‍රියාකිරීමට නොහැකි වුවත් එදිනෙදා දකින පරිහරණය කරන වස්තූන් එනම් පිගාන-කෝප්පය ඇඳ, මේසය-පුටුව, ඇඳුම්-පැලඳුම් ආදිය සම්බන්ධ ක්‍රියා තේරුම්ගත හැකිය.
- නිවැරදිව කථා කළ නොහැකි වුවත් සංඥා, ශබ්ද සහ කායික භාෂා භාවිතා කළ හැකිය.
- ඔවුන් වටා සිටින්නන් ඔවුන්ගේ පුද්ගල අවශ්‍යතා සැලකිල්ලට නොගන්නා විට උදාසීන වේ.
- අත්දැකීමෙන් අවබෝධ කරගත හැකිය.

**B කාණ්ඩය**

- කාලය සහ අනුපිළිවෙළ මතක තබාගත හැකිය.
- අවබෝධ කරගැනීමේ සහ සංවිධානය කර ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇත.
- තම වටපිටාව ක්ෂණිකව තේරුම් ගැනීමේ හැකියාව ඇතත් දක්නට නැති දෙයක් පිළිබඳව හැගීමක් නැත.
- අත්දැකීම් සීමා සහිත නිසා අත්දැකීම් නෙත් අවස්ථාවකට යෙදාගැනීම අපහසුය.

- තරමක මතකයක් ඇති නිසා භාණ්ඩ සහ උපකරණ හඳුනා ගැනීමටත් එමගින් කෙරෙන කාර්යයන් පිළිබඳ අවබෝධයක් ඇත.
- පෙර දින සිදු වූ ප්‍රධාන දේවල් මතකයේ ඇත.
- කාලය පිළිබඳ හැකියාවන් දියුණු කළ හැකිය.
- ද්‍රව්‍ය වල ගුණාත්මක බව සහ එම ද්‍රව්‍ය සාදාතිබෙන්නේ කුමකින්ද යන්න පිළිබඳ මෙන්ම ප්‍රමාණයක් පිළිබඳව එනම් ස්වල්පයක්, ගොඩක් වශයෙන් අවබෝධයක් ඇත.
- කථා කළ හැකි අතර, වාග් මාලාව ක්‍රමිකව වර්ධනය වේ.
- කථනය තේරුම් ගත හැකිය.
- වෙනස්වන දේ පිළිබඳව අඩු අවබෝධයක් ඇති අතර යමක් නිර්මාණය කරන අයුරු නොදක්කේ නම් එය කළ නොහැක.
- ප්‍රායෝගික අත්දැකීම් වඩ වඩාත් ලැබීම මත ඉගෙනුම සෙමෙන් සිදු වේ.

**C කාණ්ඩය**

- අද හෙට ඊයේ පෙරේදා වශයෙන් දින, සති, මාස වශයෙන් කාලය පිළිබඳ අවබෝධයක් ඇත.
- ස්ථානයක සිට තවත් ස්ථානයකට යා හැකි කෙටිම පිළිබඳව තෝරාගැනීමට අවබෝධයක් ඇත.
- නුපුරුදු පරිසරයකට මාරුවීමේදී පෙර හමුවී හෝ දැක ඇති දේ හෝ අය සමග සම්බන්ධවීමට තේරුම් ගැනීමට හැකියාව ඇත.
- ප්‍රමාණය පිළිබඳ සංකල්පය හුරුවන විට 1 හා 2 අතර හෝ 1 හා 3 අතර වෙනස හඳුනාගත හැකිය.
- හොඳ මග පෙන්වීමත් යටතේ කියවීම, ලිවීම දියුණු කළ හැකිය.
- සංඛ්‍යා වෙනුවට සංකේත සහ මුදල් වෙනුවට චෙක්පත් භාවිතය වැනි සංකල්ප රෙුම් ගැනීමට අපහසුය.
- සත්‍ය දේ මගින් අත්දැකීම් ලබාදීමට උත්සාහ කිරීම උචිතය.

ඉගෙනීමේ දුෂ්කරතා පවතින ළමුන්ට ලබාදෙන අධ්‍යාපන රටාව ක්‍රම දෙකකට තක්සෙරු කළ හැකිය.
1 අවිධිමත් අධ්‍යාපන රටාව
2 විධිමත් අධ්‍යාපන රටාව

අවිධිමක් තක්සේරුවේදී නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා හා පරීක්ෂණ මට්ටමේ තක්සේරුවක් සිදුකරයි. විධිමත් තක්සේරුව තුළදී සාමාන්‍ය බුද්ධි පරීක්ෂණ, අභියෝග්‍යතා පරීක්ෂණ, සාධක පරීක්ෂණ හා පෞරුෂතා පරීක්ෂණ ලෙසින් සිදු වේ.

එක් එක් දරුවාගේ සාධන මට්ටමට හඳුනා ගැනීමට සාධක පරීක්ෂණ ඉවහල් වේ. ඒ යටතේ,
1 දරුවන්ගේ ගැටලු සුවිශේෂීව හඳුනාගැනීම.
2 දරුවා අවබෝධකර ගැනීම.
3 ඉගෙනුම් දුබලතා සොයාගැනීම.
4 අවශ්‍ය ප්‍රතිකාර්ය වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම
ඔස්සේ දරුවාගේ සාධක මට්ටම අවබෝධ කර ගත හැකිය.

**දෙමාපියන් සහ ගුරුවරුන් සඳහා උපදේශන ක්‍රියාවලිය**
1 දරුවා අසරණයෙක් නොවන පරිදි තේරුම් ගැනීම සහ කටයුතු කිරීම
2 තද නීති සහ විවේචන රහිත පරිසරයක ඉගෙනුම ලැබීමට අවස්ථාව ලබාදීම
3 මෝඩ කම්මැලි හෝ අලස තැනැත්තෙකු ලෙසින් නොසලකා ඉගෙනුම් කටයුතු සඳහා ගන්නා ආයාසය තේරුම් ගැනීම
4 ගුරුවරුන් සහ වැඩිහිටියන් ඔහු ඇය කෙරෙහි බලාපොරොත්තු තබා සිටිනා බව ඒත්තු ගැන්වීම

විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අධ්‍යාපනය ලබාදෙන ගුරුවරුන් පහත දක්වෙන කරුණු අනුගමනය කිරීමෙන් එම දරුවන්ට යහපත් ගුරුවරයකු හිමිකරදිය හැකිය.

- අගතිගාමී නොවීම
- නම්‍යශීලී වීම
- ඉගෙනුම් දුබලතාවන්ගෙන් යුත්වූවන් ඉගෙනීමට බැරි යැයි නිගමනය කොට කිසිම දරුවකු කොන් නොකිරීම
- අඩුවැඩි වශයෙන් දුබලතාවයන් දක්වූවත් වෙනසක් නෙවෙන පරිදි සියලු දරුන්ට සමානව සැලකීම
- නිරීක්ෂණයෙන් අවබෝධ කොටගෙන ළමයාගේ යහපතට හේතුවිය හැකි යි අවංකවම හැගෙන ආකාරයට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් සකස් කිරීම

විශේෂ අවශ්‍යතා සහිත දරුන්ගේ අධ්‍යාපනය ක්‍රමවත් විධිමත්ව පවත්වා ගෙන යාම සහ ඒ පිළිබඳව වඩාත් ඵලදායී අවබෝධයෙන් යුතුව, කටයුතු කිරීම වගකිවයුතු සියල්ලන් සතු කාර්යයකි.

**ජයතිලක වීරක්කොඩි, කළමනාකරු, ආබාධිත සේවා නිවාසය, ස්වර්ණදාම පදනම, දුන්කන්නාව,නාත්තන්ඩිය**



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් "අන්වේක්ෂනා '23" නමින් විශිෂ්ට ව්‍යවහාර සංග්‍රහයක්

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අන්වෙක්ෂනා '23 නමින් විශිෂ්ට ව්‍යවහාර සංග්‍රහයක් ප්‍රකාශයට පත් කොට තිබේ. එහි සංස්කාරක මණ්ඩලය විසින් තමන් වෙත ලද වයඹ පාසල් පද්ධතියේ විශිෂ්ට ව්‍යවහාර පිළිබඳ ව වාර්තාවක් අතරින් පහත සදහන් මාතෘකා ඔස්සේ තෝරාගත් සිද්ධි අධ්‍යයන ග්‍රන්ථයට ඇතුලත් කර ඇත.

- සහජීවනයෙන් ගොඩ නැගෙමු
- තරු හා මල්
- නැණ මල් ගුවන් විදුලිය
- සොබා දහමට පෙම් බදින්නෝ
- දිරිය, දියුණුවේ මගයි
- විදු දීප අරුණලු
- රන්හද යාය
- ලෙඩ දිනන අරුණැල්ල
- කදුලට සමුදුන් පළමු පාසල් ගමන
- ජිවිතයට අරුතක් - වෙනසකට මොහොතක්
- සිතුවිලි
- බැති ගියෙන් ඔබ්බට
- தலைகாட்டும் கலங்கரை விளக்கு
- එක්ව පෙරට
- දියමන්ති

*මංගලලාල් සත්කුමාර මහතා*


# බලධාරීන්ගේ අවධානය යොමු වේවා ...!

වයඹ පළාත තුල ඉරිදා හා පෝය දිනවල උපකාරක පන්ති පැවැත්වීම සම්පූර්ණයෙන් තහනම් කරමින් 2015 මාර්තු මස 09 වන දින ගැසට් නිවේදනයක් නිකුත් කර ඇත. උපකාරක පන්ති සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී පූර්ණ බලතල වයඹ මානව සම්පත් අධිකාරිය සතුය.

එම ගැසට් නිවේදනයට අනුව වයඹ පළාතේ ඉරිදා හා පෝය දිනවල පෙ. ව. 6.00 සිට ප. ව. 1.30 දක්වා පළමු ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා පාසල් සිසුන්ට උපකාරක පන්ති පැවැත්වීම නොකළ යුතු බවට දක්වා තිබේ. එසේම මෙම ගැසට් නිවේදනය අනුව වයඹ පළාතේ උපකාරක පන්ති පවත්වනු ලබන සියලු දෙනාම වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය යටතේ ලියා පදිංචි විය යුතුය. මෙම නියමයන් කඩ කරන අයට වසරක සිර දඬුවමක් හෝ රු. 50,000 ක දඩයක් හෝ එම දඬුවම් දෙකම නියම කල හැකිය.

එමනිසා මෙම නීති රීතිවලට පිටින් තම අභිමතය පරිදි ඉරිදා දිනවල මෙන්ම පෝය දිනවල ද, උපකාරක පන්ති පවත්වා ගෙන යන්නවුන්හට නිතිය ක්‍රියාත්මක කරමින් නිතිය බලාත්මක කරන ලෙස අදාළ බලධාරීන් ගෙන් ඉල්ලා සිටිමු.

*කලා භූෂණ රාජ්‍ය සම්මානලාභී කේ. ඩී. පීරිස්*



# පු/අඟුණවිල කනිෂ්ඨ විද්‍යාලයේ සිය වසර සැමරුම් උත්සවය





පු/අඟුණවිල කනිෂ්ඨ විද්‍යාලය විසින් පවත්වන ලද සිය වසර (1924 - 2024) සැමරුම් අධ්‍යාපන සතියට සමගාමීව මනුසත් ලංකා පදනම හා විනිවිද සංවිධානයේ සහය ඇතිව පු/අඟුණවිල කනිෂ්ඨ විද්‍යාලයීය ආදී ශිෂ්‍ය සංගමය, පුත්තලම කලාප අධ්‍යාපන කාර්යාලය හා පල්ලම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයේ අනුමැතිය සහිතව 2024 මාර්තු මස 18 වන දින පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර චිත්‍ර, ගද්‍ය හා පද්‍ය තරගාවලියක් පවත්වන ලදී. කාණ්ඩ පහක් යටතේ පවත්වන ලද මේ තරගාවලියේදී ඒ ඒ කාණ්ඩය යටතේ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබාගත් අයවලුන් සඳහා පදක්කම් හා සහතිකපත් හිමි විය.

එල්. එම්. සිහාන් ක්‍රිස්ටි

# වැඩි දියුණු කරන ලද ChatGPT

ChatGPT අධ්‍යාපනික ක්ෂේත්‍රයේ පමණක් නොව, සෑම ක්ෂේත්‍රයකම පුළුල්ව ව්‍යාප්තව තිබෙන නව අංගයක් ලෙස ChatGPT හඳුනාගත හැකිය. චැට් බොට්ස් පවුලේ ගෝලීය යෝධයා ලෙස හඳුන්වයි. වර්තමානය වන විට අපට නිදහසේ ඒ සඳහා ලගාවීමට හැකියාවක් පවතී. නව ChatGPT හි වෙනස්වීමත් සමග විද්‍යාඥයන්, පර්යේෂකයන් හා අධ්‍යාපනඥයන් මෙය යොදාගනී. වැඩි දියුණු කරන ලද ChatGPT හි පුද්ගලාරෝපිත, අන්තර් ක්‍රියාකාරී හා මානුෂීය ස්වභාවයක් සැපයීම මෙන්ම ස්වාධීනතත්වය සමඟ ඉගෙනීමේ අත්දැකීම් ලබාදීම විශේෂිත ලක්ෂණයන් වේ. එමඟින් ඉගැනීම් සම්බන්ධ අභිරුචිකම් ඇතිකිරීම හඳුනාගත හැකිය. එසේම මෙය අධ්‍යාපනය ලබන්නන්ගේ උසස් අධ්‍යාපන කුසලතා වර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක වුවද, උපාධි අපේක්ෂකයින් හා සසඳන විට ගැඹුරින් අවශ්‍ය වන ඇගයීම් හා




විශ්ලේෂණ හැකියාව ChatGPT හි මගින් සිදු කල නොහැක. යමක් අවබෝධ කර ගැනීමේදී මිනිස් මනසේ සංකල්ප, ප්‍රතිචාර ජනනය කිරීම හා තර්ක කිරීමේ හැකියාවන් සැලකීමේ දී මිනිසාගේ බුද්ධිමත් බව වඩා උසස් බව කිව යුතුය.

# අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් හා දුරකතන අංක.

| | |
|---|---|
| ගරු සභාපති  චන්දන බණ්ඩාර මහතා | 0718138087 |
| ගරු ලේකම් කේ. ඩී. පිරිස් මහතා | 0776169400 |
| ගරු භාණ්ඩාගාරික චමින්ද පියසේකර මහතා | 0714122052 |
| ගරු උප සභාපති හා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික (උතුරු මැද) යසවතී වාසල මහත්මිය | 0768211892 |
| ගරු උප ලේකම් හා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික (මධ්‍යම) එස්. පී. මෝහන් මහතා | 0776309096 |
| අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික (ඌව) වජිර උමගිලිය මහතා | 0716573442 |
| අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික (වයඹ) මංගල ලාල් සත්කුමාර මහතා | 0772695843 |
| අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික (නැගෙනහිර) එම්. ජේ. රියාස් මහතා | 0761480759 |
| අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික (දකුණ) එච්. කේ. ගුණතිලක මහතා | 0718149727 |
| අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික (සබරගමුව) රන්ජිත් වික්‍රමසිංහ මහතා | 0715347080 |
| අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික (බස්නාහිර) ඩබ්. හේවගේ මහතා | 0768210077 |
| ජාත්‍යන්තර සංවිධාන නියෝජිත කමල් හේරත් මහතා | 0773572751 |
| ගුරු සංගම් නියෝජිත ඇන්ජෙලා විජේසිංහ මහත්මිය | 0718663202 |
| තරුණ හා ආන්තික ප්‍රජා කණ්ඩායම් නියෝජිත මහින්ද සිල්වා මහතා | 0718490669 |

# මීළඟ කලාපයෙන්, ඔබේ හඬට, අපෙන් පිටුවක්....

ඔබ ප්‍රදේශයේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රවීනයෙක් වන ඔබට,
අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ ලිපි, පද්‍ය, ජයග්‍රහණ මෙන්ම ඔබ ජීවත් වන ප්‍රදේශයේ සුවිශේෂ අවස්තාවන් අපට කියන්න. මීලග හඩ සගරාව සඳහා ඔබේ නිර්මාණ 2024 සැප්තැම්බර් 20 ට පෙර lakmalicedsrilanka@gmail.com මෙම ලිපිනයට එවන්න.

සිංහල ලිපි : Font – FMAbhaya, Size 12

ඉංග්‍රීසි ලිපි : Font – Times New Roman, Size 12



## ඔබ දන්නවාද?........

- ශ්‍රී ලංකාවේ 2022 දත්ත වලට අනුව සමස්ත තරුණ සාක්ෂරතාව **98.76%** ක් වන අතර වැඩිහිටි සාක්ෂරතාව **92.64%** කි.
- ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 18 සහ ඊට වැඩි ජනගහනය **16,044,634** ක් ලෙස වාර්තා වේ. එම ජනගහනයෙන් **53.1%** ක් පමණ ශ්‍රම වෙළඳපොළට ක්‍රියාකාරිව සහභාගී වේ.
- සේවයේ යෙදෙන, මුළු ශ්‍රම බලකායෙන් **24.7%** ක් ප්‍රථමික වෘත්තීන්හි යෙදෙයි.
- මුළු ශ්‍රම බලකායෙන් **5%** ක ප්‍රමාණයක් රැකියා විරහිතයන් ලෙස වාර්තා විය.
- රැකියා විරහිතයින්ගෙන් **4%** ක් 10 ශ්‍රේණිය සමත් ව ඇත.
  - ▲ **7.1%** සාමාන්‍ය පෙළ සමත් වූවන් ය.
  - ▲ **9.1%** උසස් පෙළ සමත් වූවන් ය.

Source: Coalition for Educational Development (CED), Sri Lanka
CED Adult Learning and Education (ALE) Report, 2022
Asia South Pacific Association for Basic and Adult Education (ASPBAE)







අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසැලසුම පිළිබඳව මාධ්‍යවේදීන් කණ්ඩායමක් දැනුම්වත් කිරීමේ වැඩසටහනේ විශේෂ අවස්ථා

# අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ 2024 වසරේදී පවත්වන ලද ධාරිතා සංවර්ධන සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්






**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව මාධ්‍යවේදීන් කණ්ඩායමක් දැනුම්වත් කිරීමේ වැඩසටහන**

ශ්‍රී ලංකාවේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසැලසුම පිළිබඳව මාධ්‍යවේදීන් කණ්ඩායමක් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් 2024 මාර්තු මස 27 වැනි දින පවත්වන ලදී. මෙම වැඩසටහන ශ්‍රී ලංකාවේ ප්‍රධාන සඟරාවේ මාධ්‍යවේදීන් 20 දෙනෙකු සහභාගි වූහ. නව අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සහ එහි අන්තර්ගතය පිළිබඳවත්, අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් සිවිල් සමාජ දෘෂ්ටිකෝණයෙන් යුතුව සිදු කරන ලද නිරීක්ෂණයන් මෙහිදී මාධ්‍යවේදීන් වෙත ඉදිරිපත් කරන ලදී. නව අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට ඇතිවිය හැකි සෘණාත්මක බලපෑම් මෙන්ම එවැනි තත්ත්වයන් මගහරවා ගැනීමටත්, එම යෝජනාවලිය මගින් ඉදිරිපත් කර තිබෙන ධනාත්මක වැඩපිළිවෙළ පිළිබඳවත්, අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ මතය ඔවුන් වෙත ඉදිරිපත් කරන ලදී. වැඩමුළුව මෙහෙයවීම ප්‍රවීණ මාධ්‍යවේදී ජයසිරි ජයසේකර විසින් සිදුකරන ලදී. වැඩමුළුවෙන් පසුව එයට සහභාගී වූ මාධ්‍යවේදීන් නව අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව පිළිබඳ විවිධ පැතිකඩ පිළිබඳ මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාදිලියෙන් ලිපි ගණනාවක් පළ කළ අතර ඒවායින් කිහිපයක් පහතින් දැක්වේ.

**විශ්වීය ඉගෙනුම් සැලසුම් පිළිබඳ වැඩසටහන**

1990 ජොම්ටියන් සමුළුවෙන් පසුව ඉදිරිපත් වූ සැමට අධ්‍යාපනය ලබාදීමේ සංකල්පය ලෝකයේ ජන සමාජයන්හි අධ්‍යාපනය සම්බන්ධ සිතුම්-පැතුම් සහ ක්‍රියාදාමයන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු කිරීමට සමත්විය. සැමට අධ්‍යාපන සංකල්පය වඩාත් අර්ථාන්විත කිරීම සඳහා පසුව හඳුන්වාදෙන ලද අන්තර්කරණ අධ්‍යාපනය, සම සාධාරණත්වයෙන් යුත් අධ්‍යාපනය වැනි සංකල්ප ලොවපුරා ඉමහත් බලපෑමක් ඇති කළේය. සමාජයේ සෑම ජන කණ්ඩායමකටම සහ විශේෂයෙන්ම නොයෙකුත් ආබාධිත තත්ත්වයන්හි පසුවන්නන්ගේ අධ්‍යාපන අවස්ථා සහතික කරලීම සඳහා විශේෂිත පහසුකම් සහ නව අධ්‍යාපන ක්‍රම පිළිබඳව පසුකාලීනව අවධානය යොමුවිණි. සමානාත්මතාවය සහ සමසාධාරණ අධ්‍යාපන අවස්ථා යන සංකල්පයෙහි නවතම ප්‍රවේශය වන විශ්වීය අධ්‍යාපන සැලසුම්වලදී මෙයට ඉහතින් පැවැති සීමාවන්ද, තවදුරටත් අවම කරලීමට උත්සාහ දරනු ලැබේ. විශ්වීය අධ්‍යාපන සැලසුම් පිළිබඳ සංකල්පය සම්බන්ධයෙන් අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජික සංවිධාන දැනුම්වත් කිරීමේ වැඩසටහනක් අප්‍රියෙල් මස 8 වැනි දින කොළඹ දී පවත්වන ලදී. මෙයට සාමාජික සංවිධාන සාමාජිකයින් 42 සහභාගි වූහ. වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ලබා දුන්නේ ආචාර්ය TLD පෙරේරා මහතා ය.

**ආපදා කළමණාකරණ උපක්‍රම සහ අධ්‍යාපනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන**

අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජික සංවිධාන නියෝජිතයින් සඳහා ආපදා කළමණාකරණ උපක්‍රම සහ අධ්‍යාපනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් 2024 අප්‍රියෙල් මස 30 වැනිදා කොළඹ දී පවත්වන ලදී. මෙම වැඩසටහනේ මූලික අරමුණ වූයේ දැනට ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආයතන, ව්‍යුහයන්, හා ඒවායේ කාර්යයභාරය, අධිකාරිත්වය දූරීමේ අනුපිළිවෙළ, ආපදා කළමනාකරණ කමිටු සහ මෙම ක්‍රියාවලියට මැදිහත්වීමට සිවිල් සමාජ නියෝජිතයින්ට අවස්ථාවන් මොනවාද යන්න, පිළිබඳව අපගේ සාමාජික සංවිධාන නියෝජිතයින් දැනුම්වත් කිරීමය. එසේම සාමාජික සංවිධාන නියෝජිතයින් ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නියෝජිතයින් සහ බලධාරීන් හා සම්බන්ධ කිරීම මෙහි තවත් අරමුණක් විය.

මෙම දැනුම්වත් කිරීමේ හා පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම තුළින් ලබාගත් දැනුම සහ සම්බන්ධතා අප විසින් ක්‍රියාවට නංවමින්, පවත්නා පළාත් හා අධ්‍යාපන කමිටු මගින් ඉදිරියේදී සිදුකිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සඳහාද උපයෝගී කරගැනීමට අධ්‍යාපන සංවර්ධන සන්ධානය අපේක්ෂා කරනු ලැබීය.


**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**
**නො. 17, ධර්මපාල පෙදෙස, රාජගිරිය**
**Web: cedsrilanka.org**
**දුරකතනය : 0112887642**